# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1980/34- 2016 අගෝස්තු මස 18 වැනි බ්‍රහස්පතින්දා - 2016.08.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය.*: 3/2/8/9/1.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය.*: 4/3/15/2010/VE/297.

ගම් පුළුල් කිරීම යටතේ බෙදා දීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින් 1934 අංක 38 දරන ඉඩම අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර*:-

නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපනේ කෝරලේ සුළු කොට්ඨාසයේ, මැතගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මු. පී. නු. 2900 දරන 2013.11.07 දිනැති මුලික පිඹුරේ දක්වා ඇති, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.9223 ක් පමණ වන පහත විස්තර කර ඇති ඉඩම් කැබැල්ල.

**1. කැබලි අංක 1**

ඉඩමේ නම: දොඹගස්තලාව; වසම: 456 H, දොඹගස්තලාව; විස්තරය: ගම පුළුල් කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්ටයාර් 2.9223.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 සැප්තැම්බර් මස 20 වැනි දින පෙ. ව 9.00 කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2016 සැප්තැම්බර් මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

අයි. එම්. සේනානායක,
ප්‍රාදේශීය ලේකම්,
කොත්මලේ.

2016 අගෝස්තු මස 12 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේදී ය.

09—129

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 24049 - 27 - (2016/08)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.